ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය

இலங்கையின் பிரதம அமைச்சர்

**Prime Minister of Sri Lanka**

**රාමසාන් (ඊදුල් ෆිතර්) උත්සවය වෙනුවෙන් අග්‍රාමාත්‍යතුමියගේ සුභපැතුම් පණිවුඩය.**

මසක කාලයක් පුරා දැඩි උපවාසයක නිරත වෙමින්, ආධ්‍යාත්මික ශික්ෂණය ප්‍රගුණ කළ ලෝකවාසී මෙන්ම ශ්‍රී ලාංකික ඉස්ලාම් බැතිමතුන් මහත් හරසරින් සමරනු ලබන ඊදුල් ෆිතර් හෙවත් රාමසාන් උත්සවය වෙනුවෙන් සුභාශිංසන පිරිනමනුයේ ඉමහත් සතුටිනි.

රාමසාන් සමය යනු හුදෙක් ආහාර පානවලින් වැළකී සිටීම පමණක් නොව ඉවසීම, කැපකිරීම සහ අනුන්ගේ දුක හඳුනාගැනීම වැනි උතුම් මානුෂීය ගුණාංග ජීවිතයට සමීප කරගන්නා කාලයකි. මෙම උතුම් වටිනාකම් පෞද්ගලික ජීවිතයට පමණක් සීමා නොකර, රටේ පොදු යහපත උදෙසා යොදා ගැනීම වර්තමානයේ අප හමුවේ ඇති ප්‍රධාන අවශ්‍යතාවකි.

අප රටේ පවතින විවිධත්වය අපට ශක්තියකි. රාමසාන් උත්සවය අපට උගන්වන සහෝදරත්වය සහ සහජීවනය යන පණිවුඩය, ශ්‍රී ලාංකිකයන් ලෙස එක් ධජයක් යටතේ නැගී සිටීමට අපව දිරිමත් කරයි. ආගමික සහ සංස්කෘතික බැඳීම් ශක්තිමත් කරමින්, ජාතීන් අතර ගොඩනැගෙන අන්‍යෝන්‍ය විශ්වාසය හා ගෞරවය මත රටේ තිරසාර සාමය සහ සමෘද්ධිය රඳා පවතී.

අප මෙලෙස සහෝදරත්වයෙන් රාමසාන් සමරන මොහොතක, ලොව පුරා පවතින යුද ගැටුම් හේතුවෙන් පීඩාවට පත්ව සිටින ජනතාව පිළිබඳව ද අපගේ අවධානය යොමු විය යුතුය. විශේෂයෙන්ම මැදපෙරදිග කලාපයේ පවතින අවාසනාවන්ත යුධමය වාතාවරණය හමුවේ ඉස්ලාමීය බැතිමතුන් ඇතුළු සමස්ත ජනතාව මුහුණ දී සිටින අතිශය දුෂ්කර හා වේදනාකාරී තත්ත්වය පිළිබඳව අප දැඩි සංවේගයක් පළ කරමු. මානව හිමිකම් සහ මානුෂීය වටිනාකම් අභියෝගයට ලක්ව ඇති මෙවන් යුගයක, යුද්ධයේ බිහිසුණු බවින් පීඩිත ජනතාවට කඩිනමින් සහන සැලසීමත්, එම කලාපයන් තුළ සාමය සහ ස්ථාවරත්වය ස්ථාපිත වීමත් සමස්ත ලෝක ප්‍රජාවගේම වගකීමක් මෙන්ම ප්‍රාර්ථනාවකි.

ගෝලීය අභියෝග හමුවේ හුදෙකලා නොවී, එකිනෙකාට උදව් කරමින් සහෝදරත්වයෙන් කටයුතු කිරීම සමාජ ස්ථාවරත්වයට ශක්තිමත් අඩිතාලමකි. රාමසාන් උත්සවයෙන් නිරූපණය වන මෙම ආධ්‍යාත්මික ශික්ෂණය, වත්මන් අර්බුද ජයගෙන රටක් ලෙස සමෘද්ධිය කරා යන ගමනේදී අප සැමට මහත් ශක්තියක් වනු නොඅනුමානය.

තමා සතු දෙයින් කොටසක් නැති බැරි අය වෙනුවෙන් පරිත්‍යාග කරමින් (සකාත්), සමාජ සාධාරණත්වය ඉස්මතු කරන මෙම උතුම් දිනයේ, සියලු දෙනා එක්ව වඩාත් යහපත් සහ සහයෝගී ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට අදිටන් කරගත යුතුය. මෙම රාමසාන් උත්සවය ඔබ සැමට සතුට, සාමය සහ සෞභාග්‍යය සපිරි ජීවිතයක මූලාරම්භය වේවායි ප්‍රාර්ථනා කරමි.

ඔබ සැමට සුභ රාමසාන් දිනයක් වේවා!

Harinimarasuriya

ආචාර්ය හරිනි අමරසූරිය

අග්‍රාමාත්‍ය,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය.